# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2015 මැයි මස 26 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09. 30 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
උදය ප්‍රභාත් ගම්මන්පිල
උදාර රත්නායක
උදේන විජේරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සුනිල් ජයමිණී
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසිල් කිඳෙල්පිටිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

ආනන්ද රංජිත් රූපසිංහ
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
උපාලි ගුණරත්න
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එඩ්වඩ් ගුණසේකර
කේ.ඩී. ලාල්කාන්ත
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් පී. විතාන
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
මනෝ ගනේෂන්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
රජිත හපුආරච්චිගේ
රවී විජේසේකර
රොයිස් විජිත
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
විජිත් ප්‍රියන්ත
ශිරන්ත අමරසේකර
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
සුසාර දිනාල්
හිරුණිකා එරංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදනය :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් නිවේදනය කරන ලදී.

*" 2015.03.07 දින සභා සම්මත වූ බස්නාහිර පළාතේ පළාත් සභාවේ සහකාර හැන්සාඩ් සංස්කාරක තනතුර හා හැන්සාඩ් වාර්තාකරු/ලඝු ලේඛක තනතුරු සම්බන්ධයෙන් වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා, ගරු ආණ්ඩුකාරතුමා හා ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යොමු කර තිබෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2015.05.13 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව වාර්තා පිළිගන්වන ලදී.

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2007/2008 වර්ෂයන්හි විගණකාධිපතිවරයාගේ වාර්තාවන් හා සම්බන්ධ වූ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා සභාවට පිළිගන්වන ලදී.

## 03. පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2014 වර්ෂය

*ගරු සභාපතිතුමනි, " අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2014 නැමැති උපලේඛනයේ දැක්වෙන පරිදි, එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි "* යනුවෙන් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***පූ.භා. 10.30 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.27 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

## 04. රීති අංක 107 යටතේ යෝජනාව :

උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූ ද පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 05. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : [ඉල්ලා අස් කර ගන්නා ලදී.]

උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"බස්නාහිර පළාත් මාර්ග අමාත්‍යාංශය ලෙස බස්නාහිර පළාත තුළ තිබෙන සියලුම සී හා ඩී ශ්‍රේණි වලට අයත් මාර්ගද ඇතුළුව අනෙකුත් ශ්‍රේණිවලට අයත් මාර්ග හා ඒවාට ප්‍රවේශ වන මාර්ගයන්ගෙන්ද 30% ක ප්‍රතිශතයක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සංවර්ධනය කිරීමේ අයිතිය අප අමාත්‍යාංශය වෙත ලබා ගැනීම උචිත වේ. "*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 11.30 ට, සභාවේ ගණපූරණය නොමැති බව සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, කැඳවීම් සීනුව නාද කරන ලදුව පසුව ගණපූරණය ඇති විය.***

***පූ.භා. 11.44 ට, සභාවේ ගණපූරණය නොමැති බව ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, කැඳවීම් සීනුව නාද කරන ලදුව පසුව ගණපූරණය ඇති විය.***

***එවලේ, විපක්ෂය විසින් එකී යෝජනාවට විරුද්ධත්වය පළ කළ අතර, අනතුරුව ඇති වූ නොසන්සුන්තාවය මත, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පූ. භා. 11.49 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ.භා. 12.04 ට යළිත් රැස්විය.***

***අනතුරුව, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා විසින් රීති අංක 107 යටතේ ඉදිරිපත් කරන ලද සිය පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලදී.***

## 06. කල් තැබීම :

පසුව, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.13 ට, 2015 ජූනි මස 09 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.05.27
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/27
Minuts 2015.05.27 - Hansard Section